
## වෙළඳ බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය



## 03.1 හැඳින්වීම

බල ප්‍රදේශයේ ජනතාවගේ සෞඛ්‍ය, සුඛ විහරණය, පහසුව සහ සියලු පහසුකම් ආරක්ෂා කිරීමට අදාළ කරුණු විධිමත් කිරීම, පාලනය කිරීම හා පරිපාලනය කිරීම පළාත් පාලන ආයතනවලට පැවරී ඇති කර්තව්‍යයන් අතර ඇති ප්‍රධාන කාරණා වේ. බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යනු ලබන වෙළඳාම් හෝ ව්‍යාපාර අතරින් මහජන සෞඛ්‍යයට, සුඛ විහරණයට හා පහසුවට බලපෑමක් ඇති විය හැකි වෙළඳාම් හෝ ව්‍යාපාර විධිමත් කිරීම හා පාලනය කිරීමට අදාළව පළාත් පාලන ආයතන විසින් සාදන ලද අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන යටතේ ඒ වෙළඳාම හෝ ව්‍යාපාරය පවත්වා ගෙන යනු ලබන ස්ථානය සඳහා ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් නිකුත් කරනු ලැබූ බලපත්‍රයක් ලබා ගත යුතුය. මේ කාර්යය නිසියාකාරව ඉටු කිරීම එම සභාවේ වගකීම වේ.

සටහන: පළාත් පාලන ආයතනයක් විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාද එම ආයතන විසින් සාදන ලද අතුරු ව්‍යවස්ථා වශයෙන් සලකනු ලැබේ.

## 03.2 නෛතික අධිකාරිය

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වන හා 126 වන වගන්ති යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථා හෝ ඒ යටතේ සාදන ලදැයි සලකනු ලබන සම්මත අතුරු ව්‍යවස්ථා

(ආ) ප්‍රාදේශීය සභා පනතේ149 වන වගන්තිය

(ඇ) වයඹ පළාත් සභාවේ 1990 අංක 12 දරන වයඹ පළාත් පාරිසරික ප්‍රඥප්තියේ 55 වගන්තිය

(පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබා ගත යුතු කර්මාන්තයක් වන විට පමණක් අදාළ වේ)

## 03.3 සුදුසුකම්

(අ) අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ, පළාත් පාලන ආයතනයකින් බලපත්‍රයක් ලබා ගත යුතු වෙළඳාමක් හෝ ව්‍යාපාරයක් විය යුතුය.

(ආ) ජාතික පාරිසරික පනත යටතේ සාදන ලද නියෝග අනුව පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබා ගත යුතු කාර්යයක් වන අවස්ථාවක, වලංගු පරිසර ආරක්ෂණ බලපත්‍රයක් තිබිය යුතු ය. [වයඹ පළාත් සභාවේ 1990 අංක 12 දරන වයඹ පළාත් පාරිසරික ප්‍රඥප්තිය]

## 03.4 ගාස්තුව

(අ) වෙළඳාම හෝ ව්‍යාපාරය පවත්වා ගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකම මත ගාස්තුව පහත පරිදි විචලනය වේ.

ප්‍රාදේශීය සභා සඳහා

| ස්ථානයේ වාර්ෂික වටිනාකම | බලපත්‍ර ගාස්තුව රු. |
|---|---|
| රු. 750.00 නො ඉක්මවන විට, | 500.00 |
| රු. 750.00 ඉක්මවන හා රු. 1,500.00 නො ඉක්මවන විට, | 750.00 |
| රු. 1,500.00 ඉක්මවන විට, | 1,000.00 |

(ආ) එසේ වුවද 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 149 වන වගන්තිය යටතේම දක්වා ඇති පරිදි අදාළ හෝටලය, ආපනශාලාව, නවාතැන්පොල සංචාරක මණ්ඩලය යටතේ ලියාපදිංචි ස්ථානයක් වන විටකදී එකී හෝටලය, ආපනශාලාව, නවාතැන්පොල පෙර වසර ලැබීම් වලින් 1%කට නොඅඩු ගාස්තුවක් පනවා අයකිරීමේ හැකියාව පෙන්වා ඇත. තවද එම ව්‍යාපාරය පවත්වාගෙන යාමේ මුල් අවස්ථාව වන විටදී එකී ගාස්තුව එම ස්ථානයේ වාර්ෂික වටිනාකම මත තීරණය කළ යුතු වේ.

## 03.5 ඉදිරිපත් කළ යුතු ලේඛන

මෙහි ඇමුණුම් අංක 03 හි ආකෘතියට අනුව වන ඉල්ලුම් පත්‍රය

## 03.6 කාර්යය පටිපාටිය

| අනු අංකය | පටිපාටිය | කාල සීමාව | අධිකාරය |
|---|---|---|---|
| 1 | සම්මත අතුරු ව්‍යවස්ථා වැළඳගැනීම හෝ සභා අතුරු ව්‍යවස්ථා සම්මත කර ගැනීමට කටයුතු කිරීම | | සභාව සහ පළාත් සභාවේ විෂය භාර අමාත්‍යතුමා, පළාත් සභාව |
| 2 | බලපත්‍ර නිකුත් කළ යුතු ස්ථාන හඳුනාගැනීමේ සමීක්ෂණය (ඇමුණුම 01) | ප්‍රවර්ථන වර්ෂයේ මාර්තු 31 දිනට පෙර | ආදායම් පරීක්ෂක /සමීක්ෂණ නිලධාරි |
| 3 | සමීක්ෂණ වාර්තා අනුව බලපත්‍ර නිකුත් කළ යුතු ස්ථාන පිළිබඳ ලේඛනය පිළියෙළ කිරීම (ඇමුණුම 02) | ප්‍රවර්ථන වර්ෂයේ මාර්තු 31 දිනට පෙර | විෂය භාර නිලධාරි |
| 4 | වෙළඳ බලපත්‍ර ගාස්තු නියම කිරීමේ මහ සභා තීරණය ගැනීම | පෙර වර්ෂයේ දෙසැම්බර් මස මහා සභා රැස්වීමට පෙර | පළාත් පාලන ආයතනයේ මහ සභාව |
| 5 | වෙළඳ බලපත්‍ර ගාස්තු පැනවීමේ මහ සභා තීරණය ගැසට් පත්‍රයේ පළ කිරීම | සෑම වර්ෂයකම දෙසැම්බර් 31 දිනට පෙර | විෂය භාර නිලධාරි |
| 6 | ඉල්ලුම් පත්‍රයේ ( ඉල්ලුම් පත්‍රය ඇමුණුම් 03 පරිදි ) තොරතුරු සහ ව්‍යාපාරික ආයතන සමීක්ෂණ තොරතුරු සසඳා බැලීම | | ආදායම් පරීක්ෂක/විෂය භාර නිලධාරි |
| 7 | අවශ්‍යතාවය අනුව නිර්දේශ සඳහා මහජන සෞඛ්‍ය පරීක්ෂක වෙත යොමු කිරීම | | විෂය භාර නිලධාරි, ලේකම් |
| 8 | ස්ථාන පරීක්ෂාව කර නිරීක්ෂණ හා නිර්දේශ ඉදිරිපත් කිරීම | | මහජන සෞඛ්‍ය පරීක්ෂක |
| 9 | සභාවට අය විය යුතු හිඟ මුදල් වරිපනම් හා වෙනත් ගෙවීම් පිළිබඳ දැනුවත් කිරීම සහ සහ බලපත්‍ර ගාස්තුව අය කර ගැනීම | | පෙරටු කාර්යාල නිලධාරි / මුදල් අයකැමි |
| 10 | අය කර ගත් බලපත්‍ර ගාස්තුව අදාළ ලේඛනයේ සටහන් කර ගැනීම | ගාස්තු අය කර ගත් දින | විෂය භාර නිලධාරි |
| 11 | වෙළඳ බලපත්‍රය සකස් කර අත්සන සඳහා යොමු කිරීම (ඇමුණුම 04) | | පෙරටු කාර්යාල නිලධාරි / විෂයභාර නිළධාරී |
| 12 | බලපත්‍රය නිකුත්කිරීම | | විෂයභාර නිලධාරියා |

සටහන: 1. මෙහි ඇමුණුම් අංක 04 හි ආකෘතියට අනුව පිළියෙළ කළ බලපත්‍රය නිකුත් කළ යුතුය.
2. ඉහත පරිදි නිකුත් කරනු ලබන බලපත්‍රය අදාළ ක්‍රියාකාරකම, පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබා ගත යුතු යම් ක්‍රියාකාරකමක්ද වන විට, ඊට අදාළව පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබා ගන්නා තෙක්, පළාත් පාලන ආයතනය විසින් ඒ කාර්යය කරනු ලබන ස්ථානය සඳහා වෙළඳ බලපත්‍රය නිකුත් කිරීම නොකළ යුතුය. [වයඹ පළාත් සභාවේ 1990 අංක 12 දරන වයඹ පළාත් පාරිසරික ප්‍රඥාප්තියේ 20 වගන්තිය]

### 03.7 බලපත්‍රය නිකුත් කිරීමට මහජන සෞඛ්‍ය පරීක්ෂක නිර්දේශ නොකළ අවස්ථාව

| අනු අංකය | පටිපාටිය | කාල සීමාව | අධිකාරය / වගකීම |
|---|---|---|---|
| 1 | බලපත්‍රය නිකුත් කිරීම ප්‍රතික්ෂේප කිරීමට හේතු වන කරුණු පෙන්වා දෙමින්, ඒවා නිවැරදි කරන ලෙස නියම කිරීම | පළාත් පාලන ආයතනය වෙත යොමු කරන අවස්ථාවේ | ලේකම් ,විෂය භාර නිලධාරි |
| 2 | දැනුම් දී ඇති නියමය අනුව ක්‍රියා කරන ලද බව සභාවට දැනුම් දෙන ලිපිය භාර ගැනීම | අදාළ වන පරිදි | පෙරටු කාර්යාල නිලධාරි / විෂය භාර නිලධාරි |
| 3 | නියමය අනුව ක්‍රියා කර තිබේ ද යන්න නැවත අදාළ නිලධාරින් මඟින් ස්ථාන පරීක්ෂාව කර නිර්දේශ ලබා දීම | | මහජන සෞඛ්‍ය පරීක්ෂක |

### 03.8 වෙළඳ බලපත්‍රයක් ලබා නොගැනීමේ නෛතික ප්‍රතිවිපාක

| අනු අංකය | පටිපාටිය | කාල සීමාව | අධිකාරය |
|---|---|---|---|
| 1 | වෙළඳ බලපත්‍රය ලබා ගන්නා ලෙස නියම කිරීම *ඇමුණුම 05 | සෑම වර්ෂයකම පෙබරවාරි15 දිනට පෙර | ලේකම්/ විෂය භාර නිලධාරි |
| 2 | නියමය අනුව ක්‍රියා කිරීම පැහැර හැර ඇති විට, මහේස්ත්‍රාත් ඉදිරියේ චෝදනා පත්‍රය ගොනු කිරීම (ඇමුණුම 06,07,08) | මාර්තු 31 පසු | ලේකම්/ආදායම් පරීක්ෂක |
| 3 | වෙළඳ බලපත්‍රය ලබා ගන්නා ලෙස නැවත නියම කිරීම | අධිකරණ තීන්දු ප්‍රකාශයේ දින සිට දින හතක් ඇතුළත | ලේකම්/විෂය භාර නිලධාරි |
| 4 | දෙවන වරට කරන ලද නියමය අනුව ක්‍රියා කිරීම පැහැර හැර ඇති විට, මහේස්ත්‍රාත් ඉදිරියේ දෙවන වරට චෝදනා පත්‍රය ගොනු කිරීම | දෙවන වර දැන්වීමේ දින සිට දින 7 කට පසුව හා දින 15 කට පෙර | ලේකම් /ආදායම් පරීක්ෂක |

| අනු අංකය | පටිපාටිය | කාල සීමාව | අධිකාරය |
|---|---|---|---|
| 5 | මහේස්ත්‍රාත්වරයාගේ අතිරේක දඩයක් නියම කිරිමේ තීරණය ලබාදිම, ඒ අනුව කටයුතු කිරිම | | |
| 6 | දෙවන අවස්ථාවේදිත් බලපත්‍ර ලබා නොගන්නේ නම් මහේස්ත්‍රාත්වරයාගෙන් සමාප්ති ආඥාව ඉල්ලා සිටීම | දෙවන අධිකරණ තීන්දු ප්‍රකාශයේ දින සිට දින හතකට පසුව සහ දින 15 කට පෙර | ලේකම් /ආදායම් පරීක්ෂක |
| 7 | සමාප්ති ආඥාව නිකුත් කිරීම (ඇමුණුම 09) | | |
| 8 | වෙළඳාම් / ව්‍යාපාර ස්ථානය පිස්කල් විසින් මුද්‍රා තැබීම | සමාප්ති ආඥාවේ සඳහන් පරිදි | |

සටහන: 1. මෙහි ඇමුණුම් අංක 06 සිට 08 දක්වා ආකෘති අනුව නඩු පැවරීමට අදාළ චෝදනා පත්‍රය/ පැමිණිලි පත්රය/ දිවුරුම් ප්‍රකාශය පිළියෙළ කළ යුතුය.